**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

**<u>පුවත්පත් නිවේදනය</u>**

මහ නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය **පාඨලී චම්පික රණවක මැතිතුමා සහ ඉන්දියානු මහ කොමසාරිස්තුමා විසින් BUILDCON සහ WOOD INTERNATIONAL EXPO ප්‍රදර්ශන සමාරම්භ කෙරේ**

මහ නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා සහ ඉන්දීය මහ කොමසාරිස් ගරු තරංජිත් සිං සන්ධු මැතිතුමා විසින් අට වන වරට පැවැත්වෙන Sri Lanka Buildcon ප්‍රදර්ශනය සහ හත් වන වරට පැවැත්වෙන Wood International Expo ප්‍රදර්ශනය අද දින කොළඹදී සමාරම්භ කෙරිණ.

රාජ්‍ය දැව සංස්ථාවේ සභාපතිනි නිලූකා ඒකනායක මහත්මිය, Futurex Trade Fair & Events Pvt. Ltd හි කළමනාකාර අධ්‍යක්ෂ ප්‍රේම් අන්වේෂි මහතා , ඉන්දියානු කර්මාන්ත සංගමයේ (Confederation of Indian Industry) අධ්‍යක්ෂ අමිත් පන්ජ්වානි මහතා, ශ්‍රී ලංකාවේ ඇලුමෙක්ස් PLC හි කළමනාකාර අධ්‍යක්ෂ ප්‍රමුක් දැදිවෙල මහතා, ජැට් හෝල්ඩින්ස්

හි ප්‍රධාන විධායක නිලධාරී නිශාල් ෆර්ඩිනෑන්ඩෝ මහතා , CDC Events & Travels හි කළමනාකාර අධ්‍යක්ෂ ඉම්රාන් හසන් මහතා සහ තවත් සම්භාවනීය අමුත්තන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

ඉංජිනේරු, ප්‍රසම්පාදන සහ ඉදිකිරීම් (EPC), වාණිජ සහ නිවාස ඉදිකිරීම්, රාජ්‍ය සහ සිවිල් යටිතල පහසුකම් වැනි ක්ෂේත්‍රයන්ට සම්බන්ධ ඉන්දියානු සමාගම් 70 කට වැඩි ගණනක් ඉන්දියානු කර්මාන්ත සංගමයේ සහ ඉන්දියානු රජයේ වාණිජ සහ කර්මාන්ත අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව මෙම ප්‍රදර්ශනයට සහභාගී වේ.

මෙම අවස්ථාවේදී අදහස් දක්වමින් ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉහළ නැංවීම සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රය ලබා දෙන දායකත්වය අගය කළේය. මෙවැනි ප්‍රදර්ශන කර්මාන්තය තුළ සහ එහි නියැළෙන්නන් අතර ජාත් යන්තර සහයෝගය ඉහළ නැංවීමට උපකාරී වන බව එතුමා ප් රකාශ කළේය. එසේම ප්‍රදර්ශනය සඳහා ඉන්දියානු සමාගම් විශාල සංඛ්‍යාවක් සහභාගී කරවීම සම්බන්ධයෙන් අමාත්‍යතුමා ඉන්දියානු කර්මාන්ත සංගමයට සිය ස්තුතිය පළ කළේය.

මහ කොමසාරිස්තුමා අදහස් දක්වමින් ප්‍රකාශ කළේ , මෑත කාලයේ ශ්‍රී ලංකාවේ පැවති ප්‍රදර්ශන සඳහා ඉන්දීය සමාගම් විශාල ලෙස සහභාගී වීම තුළින් පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් පසුව යථා තත්වයට පත්වීමට ප්‍රයත්න දරන ශ්‍රී ලංකා ආර්ථිකය සහ ජනතාව සම්බන්ධයෙන් ඉන්දියානු සමාගම් සහ විවිධ

කර්මාන්තයන්හි නියුක්ත කණ්ඩායම් දක්වන විශ්වාසය පිළිඹිබු වන බවයි.

පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් පසුව අග්‍රමාත්‍ය මෝදි මැතිතුමා ශ්‍රී ලංකාවේ සිදු කළ සුහද සංචාරය ඉන්දියානු සංචාරකයන්ට සහ සහ කර්මාන්තයන්ට වැදගත් පණිවිඩයක් ලබා දුන් බවත් , ඒ අනුව නැවතත් ඉන්දීය සංචාරකයන් විශාල වශයෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන බවත් ඒ තුළින් ශ්‍රී ලංකා ආර්ථිකයේ සෑම සැපයුම් දාමයක්ම ශක්තිමත් වන බවත් මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේය. පසුගිය මාස දෙක තුළ ශ්‍රී ලංකාවට වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් පැමිණ ඇත්තේ ඉන්දියාවෙන් බවත් එම සංඛ්‍යාව දෙවනුවට වැඩිම සංචාරකයන් පිරිසක් පැමිණි රටෙන් පැමිණි සංචාරකයන් ගණන මෙන් දෙගුණයක් බවත් එතුමා සදහන් ක ළේය.

නව යටිතල පහසුකම් සඳහා වන ඉල්ලුම කඩිනමින් සහ ගැටළුවකින් තොරව සපුරාලිය යුතු සේම ප්‍රථමයෙන් ඉල්ලුම අධ් යයනය කර පරිසර හිතකාමී අයුරින් එම ඉල්ලුම සපුරාලිය යුතු බවද මහ කොමසාරිස්තුමා පෙන්වා දුන්නේය. සංවර්ධන අභිමතාර්ථයන් පාරිසරික තිරසාරත්වය සමඟ සුසංයෝගී කළ යුතු බව එතුමා සඳහන් කළේය. ඉන්දියනු වෙළඳපොල තුළ ශ්‍රී ලාංකේය සමාගම් රැසක් තිබීම පිළිබඳ සිය සතුට පළ කළ මහ කොමසාරිස්තුමා 2025 වන විට ඉන්දියාවේ කර්මාන්ත අංශයේ වටිනාකම ඇමරිකානු ඩොලර් ට්‍රිලියනයක් වන බවට අපේක්ෂිත

හෙයින් වඩාත් වැඩි සහයෝගයකින් කටයුතු කරන ලෙසට ආරාධනා කළේය.

මෙම ප්‍රදර්ශන 2019 සැප්තැම්බර් 8 වන දිනෙන් අවසන් වේ.

*****